# (ළ) මිල හා වැටුප්

## මිල

1968 වර්ෂය තුළදී බොහෝ භාණ්ඩ සම්බන්ධයෙන් තියුණු මිල ඉහළ යාම් දක්නට ලැබිණි. 1967 දී සියයට 2.2 කින් ඉහළ ගිය කොළඹ පාරිභෝගික මිල දර්ශකය 1968 දී සියයට 5.9 කින් ඉහළ ගියේය. 1968 වර්ෂය තුළදී මිල දර්ශකයට ඇතුළත් නොවන සමහර පාරිභෝජන භාණ්ඩවල මිල පහළ යාමක් ද දක්නට ලැබුණි.

1968 වර්ෂය තුළදී සිදුවූ මිල ඉහළ යෑම්වලට හේතුවූ කරුණු බොහෝමයකි. අර්තාපල් වැනි සමහර කෘෂිකාර්මික භාණ්ඩවල හිඟකම, අනික් ද්‍රව්‍යවල මිල ඉහළ යාමෙන් ඇති වූ පීඩනය හා ප්‍රධාන වශයෙන් ගතහොත් නැව් ගාස්තු වැඩිවීම, සමහර කාර්මික භාණ්ඩවලින් අය කළ පිරිවැටුම් බද්ද වැඩි කිරීම, 1968 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ලංකාවේ රුපියල අවප්‍රමාණ කිරීම, 1967 දෙසැම්බර් මාසයේ වැටුප් වැඩිවීම, එසේම 1968 මැයි මාසයේ විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය හඳුන්වා දීම හේතු කොට ගෙන භාණ්ඩවල මිල ඉහළ ගියේය. බොහෝ අවස්ථාවලදී මිල ඉහළ යෑම ඉහතින් සඳහන් කළ සාධක කිහිපයකම සමුච්චිත ප්‍රතිඵලයයි.

මිල පහළ දැමීමට උදව් කරන සමහර සාධකයන් ද විය. ඒවා අතර, ආනයන බලපත්‍රයන් අවලංගු කිරීම, ආනයන තීරුබදු අඩු කිරීම, වැඩිපුර නිෂ්පාදනය කිරීමෙන් හිඟකම් ලිහිල්වීම සහ විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය යටතේ ආනයනයන් ලිහිල් කිරීම ප්‍රධාන වේ. කෙසේ වෙතත් මිල අඩු කරන මෙම බලවේගයන් සමහර ගොඩනැගිලි උපකරණ වැනි භාණ්ඩ අතලොස්සක පමණක් මිළ පහළ දැමීමටත්, අනෙක් භාණ්ඩවල මිල විශාල වශයෙන් ඉහළ යාම වැළැක්වීමටත් සමත් විය.

### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය[1]

පහත සඳහන් සංඛ්‍යා සටහන, කොළඹ පාරිභෝගික මිල දර්ශකය භාණ්ඩ ගණ සහ අංශ වශයෙන් බෙද වාර්ෂික සාමාන්‍යයන් දක්වයි.

**සංඛ්‍යා සටහන II (ළ) 1**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය**

**( පාද වර්ෂය 1952 = 100 )**

| වර්ෂය | සියළුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | අංශ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර | රෙදිපිළි | ඉන්ධන හා එළිය ගණ | ගෙවල් කුලී | විවිධ | දේශීය කොටස | ආනයන කොටස | අපනයන කොටස |
| 1958 | 105.0 | 105.8 | 87.5 | 101.0 | 101.5 | 113.1 | 109.2 | 97.0 | 135.0 |
| 1959 | 105.2 | 104.7 | 92.1 | 102.4 | 101.5 | 115.3 | 108.0 | 97.1 | 153.1 |
| 1960 | 103.5 | 100.8 | 95.1 | 102.7 | 101.5 | 117.5 | 108.9 | 93.7 | 138.4 |
| 1961 | 104.8 | 99.8 | 103.9 | 104.4 | 101.5 | 122.8 | 112.3 | 94.6 | 119.1 |
| 1962 | 106.3 | 100.9 | 108.2 | 105.6 | 101.5 | 124.9 | 113.9 | 96.7 | 113.8 |
| 1963 | 108.8 | 103.0 | 118.2 | 103.0 | 101.5 | 126.6 | 113.4 | 102.5 | 117.7 |
| 1964 | 112.2 | 106.4 | 127.2 | 103.2 | 101.5 | 129.3 | 116.7 | 106.6 | 115.3 |
| 1965 | 112.5 | 107.3 | 126.8 | 100.7 | 101.5 | 128.3 | 116.4 | 106.4 | 127.2 |
| 1966 | 112.3 | 109.1 | 117.0 | 95.9 | 101.5 | 127.3 | 116.8 | 105.4 | 127.6 |
| 1967 | 114.8 | 112.7 | 116.7 | 96.5 | 101.5 | 128.9 | 117.1 | 111.2 | 123.9 |
| 1968 | 121.5 | 121.2 | 120.1 | 93.2 | 101.5 | 133.6 | 123.2 | 117.3 | 142.4 |

මූලය: සංගණන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

1 මෙම දර්ශකය සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්වීම විශ්ලේෂණය කොට දක්වීමෙහි ලා ප්‍රයෝජනයට ගැනීමේ අපහසුකම් ඉකුත් වාර්ෂික වාර්තාවල ද සාකච්ඡා කර ඇත. ප්‍රධාන දුර්වලතා නම් හැම පංතියකම පාරිභෝගිකයන් නියෝජනය නොකිරීම හා 1952 සිට සංශෝධනය නොකළ බර තැබීම් වලින් යුක්ත යල්පැන ඇති පාරිභෝජන රටාවක පිහිටීමය.

සියළු ශීර්ෂ දර්ශකය 1966 පැවති 112.3 සිට 1967 දී සියයට 2.2 ඉහළ යාමක් පෙන්නුම් කරමින්, 114.8 ට ඉහළ ගිය අතර 1968 දී සියයට 5.8 කින් වැඩිවී 121.5 දක්වා ඉහළ නැංගේය. ඉකුත් වර්ෂයේදී මෙන්ම 1968 වර්ෂයේදී දී ඉහළ යෑම බොහෝ දුරට සිදුවූයේ වර්ෂයේ දෙවන භාගයේදීය. 1967 දෙසැම්බරයේදී 119.3 ක පැවැති මාසික දර්ශකය ( 44 පරිශිෂ්ට සංඛ්‍යා සටහන බලන්න.) උච්චාවචන කිහිපයකින් පසු 1968 ජූනි මාස යේදී 120.3 ට ඉහළ ගියේය. එතැන් සිට නො නැවතී ඉහළ යමින් 1968 දෙසැම්බර් මාසයේදී වාර්තාවක් පිහිටුවමින් 127.4 ක් විය.

1968 දී, බදු කුලී උප දර්ශකය හැරෙන්නට අනෙක් සියළුම භාණ්ඩ කොටස් සම්බන්ධව උප දර්ශකයන් ඉහළ යාමක් පෙන්නුම් කළේය. වැඩිම ඉහළ යාම පෙන්නුම් කෙළේ ආහාර කොටසේය. එය 1966 පැවති 112.7 සිට 121.2 දක්වා 1968 දී ඉහළ ගියේය. මාසික සංඛ්‍යා අනුව අවුරුද්දේ මුල් හය මාසය තුල ස්ථාවරව පැවති ආහාර දර්ශකය, 1967 දෙසැම්බර් මාසයේ පැවති 120.1 සිට 1968 ජූනි මාසය වන විට ඉහලගියේ 120.6 දක්වා පමණි. එහෙත් 1968 දෙසැම්බර් මාසයේදී වාර්තාගත මට්ටමක් වන 127.4 ට ළඟාවිය. 1968 දෙසැම්බර් මාසයේ කිරි පිටි, උළුහාල්, රටලූණු, පිටි, මාදුරු, බටර් යන ආනයන කොට ලබා ගන්නා සමහර භාණ්ඩවල මිළ සැහෙන තරමකින් ඉහළ ගියේය. අවප්‍රමාණ කිරීමත්, එසේම බටර් වැනි සමහර භාණ්ඩවලදී විදේශ විනිමය සහතික ක්‍රමය හඳුන්වා දීමත්, හේතු කොට ගෙන ආනයන වියදම් ඉහළයෑම්, මෙම භාණ්ඩවල මිල ඉහළයෑමේ හේතුවක් වශයෙන් දැක්විය හැකිය. දේශීය වශයෙන් නිෂ්පාදනය වන ආහාර ද්‍රව්‍යවල මිළද, 1968 සැහෙන තරමකින් ඉහළ ගියේය. සියඹලා, පොල්, පොල්තෙල්, බිත්තර, මිරිස්, පපඩම් සහ අර්තාපල්වල ද මිල ඉහළ ගියේය. අර්තාපල්වල මිල 1967 මැයි මාසයේදී ඉහළ ගියේ, මෙම භාණ්ඩ ආනයනය කිරීම තහනම් කළ හෙයිනි. පොල් හා පොල් තෙල්වල මිල ඉහළ යාම 1968 අවුරුද්ද තුළදී ලෝක වෙළඳ පොලේ පොල් තෙල්වල මිල ඉහළ යෑම නිරූපණය කරයි.

සකස් කළ භෝජන, බී. ඕ. පී. තේ, විනාකිරි, රතුලූණු, තුනපහ කුඩු, මස් මාලු, එළවළු, සිසිල් බීම, වෙනත් බීම වර්ග, සුදු සීනි හා උකු කිරිවල මිල සියයට 5 සිට සියයට 10 දක්වා තරමක් දුරට ඉහළ යාමක් පෙන්විය. රුපියල අව ප්‍රමාණ කිරීමත් සමඟ, 1967 දෙසැම්බරයේදී සුදු සීනි රාත්තලක මිල ශත 5 කින් ඉහළ නංවන ලදී. සිසිල් බීම සහ වෙනත් බීම වර්ගවල මිල ඉහළ යාමට තරමක් දුරට හේතු වූයේ, පිරිවැටුම් බද්ද 1968 ජූලි මාසයේදී සියයට 5 සිට 10 දක්වා ඉහළ නැංවීමයි. එසේම 1967 දෙසැම්බරයේ සිට ලබා දුන් අන්තර් අවප්‍රමාණ දීමනා නිසා වැටුප් වියදම් ඉහළ යාමද, මෙයට හේතු වූයේයයි වාර්තාවී ඇත.

වියළි ඉඟුරු, විස්කෝතු හා කරවල මිල සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ යනු දක්නට ලැබිණ. කෙසේ වෙතත් භාණ්ඩ ස්වල්පයක මිල තියුණු ලෙස පහළ ගියේය. එනම් කොත්තමල්ලි, සුදු ළූණු හා දෙහිය. තේ කුඩු, කෝපි ඇට, ගම්මිරිස්, සූදුරු, දේශීය ජාම්වල මිල සියයට 3 – 10 දක්වා මඳ වශයෙන් පහළ ගියේය. කුළු බඩු, සරක්කු හා උම්බලකඩවල මිල ද මඳ වශයෙන් පහළ ගියේය.

ඉකුත් වර්ෂ තුනේදී පහල ගිය රෙදිපිළි පිළිබඳව ඇති උප දර්ශකය 1968 දී ඉහළ ගියේය. මේ කොටස සඳහා වාර්ෂික දර්ශකය 1967 දී 116.7 ව පැවතියත්, 1968 දී එය 120.1 දක්වා ඉහළ ගියේය. මෙම උප කොටසේ දර්ශකය, මාසික වෙනස්වීම් අනුව බලන කල මිල ඉහළ යාම පටන් ගෙන ඇත්තේ වර්ෂයේ දෙවන භාගයේදීය. රෙදිපිළි ගණයෙහි වූ, සූට් රෙදි, හා වේට්ටිවල මිල සියයට 2 – 4 දක්වා තරමක ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, කමිස රෙදි, සාරි හා මුද්‍රිත රෙදිවල මිල ඉහළ ගියේ සියයට 2 ට අඩුවෙනි. අනෙක් අතට කමිස, සරොන්, සිල්ක්, සහ තුවායවල මිල 1968 දී පහළ ගියේය.

ඉන්ධන හා එළිය කොටසේ උප දර්ශකය වර්ෂ ගණනාවක් තිස්සේ පහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළත්, 1967 දී 96.5 සිට 1968 දී 103.2 දක්වා තියුණු ලෙස ඉහළ නැංගේය. මෙම කොටස විදුලි බලය, භූමි තෙල්, දර හා ගිනි පෙට්ටිවලින් සැකසේ. මෙම දර්ශකයේ ඉහළ යාම භූමි තෙල් හා දරවල මිල ඉහළ යාම නිසා සිදු වූවකි. 1967 දෙසැම්බරයේ සිට භූමි තෙල් ගැලුමක මිල ශත 5 කින් වැඩි කරන ලදී.

විවිධ ද්‍රව්‍ය සඳහා වූ උප දර්ශකය සියයට 3.6 ක ඉහළ යාමක් පෙන්නුම් කරමින් 1967 තිබුණු 128.9 සිට 1968 දී 133.6 දක්වා ඉහළ ගියේය. මෙම කොටසේ මාසික සංඛ්‍යා අනුව ඉහළ යාම, ප්‍රධාන වශයෙන් සිදු වී ඇත්තේ 1968 වේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලඡේදයේ දීය. ජනවාරියේදී 129.2 පැවති දර්ශකය ජූනි මාසයේදී 131.6 වී, එයින් අනතුරුව දෙසැම්බර යේදී 139.0 දක්වා සීඝ්‍රයෙන් වැඩි විය. දුම්කොළ, කොණ්ඩා කැපීම් ගාස්තු, ප්‍රසාද භාණ්ඩ

මත්පැන්, ප්‍රවෘත්ති පත්‍ර, අධ්‍යාපනික උපකරණ හා ඇඳුම් පිරිසිදු කිරීමේ ගාස්තු සම්බන්ධයෙන් මිල ඉහළ යාමක් පෙන්නුම් කළේය. බයිසිකල් ටයර් හා ටියුබ් මිල ඉහල යාම නිසා, පරිවහන ද්‍රව්‍යවල මිලෙහි තරමක වැඩිවීමක් ඇතිවූ අතර, බුලත් පුවක් හා වෙනත් එවැනි ගෘහ ද්‍රව්‍යවල මිල තරමක පහළ යාමක් දක්වීය. දුම්කොළ හා මත්පැන් මිල ඉහළ යාම, දුම්කොළවලට ඉහළ බදු පැනවීම හා පොල් අරක්කු විකුණන මිල ඉහළ යාම මගින් පෙන්නුම් කරයි. රුපියල අවප්‍රමාණ කිරීමත්, වි. වි. හි. ස. ක්‍රමය හැඳින්වීම නිසාත්, ආයාත කරන ලද අමු ද්‍රව්‍යවලට වැඩියෙන් ගෙවීමට සිදුවීම නිසා ප්‍රවෘත්ති පත්‍ර හා ප්‍රසාද භාණ්ඩ වල මිල ඉහළ යාමට හේතු වන්නට ඇත.

**කොළඹ පාරිභෝගික මිල දර්ශකයට ඇතුලත් නොවූ භාණ්ඩවල මිල**

කොළඹ පාරිභෝජක මිල දර්ශකයෙන් බාහිර, සීමිත සමහරක් භාණ්ඩ සම්බන්ධයෙන් සිල්ලර මිල ගණන් ලබා ගත හැකිවී තිබේ. ඒවා ලබා ගන්නා ලද්දේ වෙළෙන්දන් සපයන මිල ලැයිස්තුවලින් හා සිල්ලර වෙළෙන්දන්ගෙන් කළ විමසීම්වලින්ය.

**පාරිභෝජන භාණ්ඩ**

1968 වර්ෂය තුළදී කැකුළු හාල් හා තම්බපු හාල්වල, කොළඹ විවෘත වෙළඳ පොළේ මිල සියයට 7 සිට 8 දක්වා ප්‍රමාණවලින් වැඩි විය. ධාන්‍ය කොටසට අයත් බාර්ලි හා සව් බොහෝ විට වෙළඳ පොලේ නො තිබුණ අතර, 1968 ජූනි තෙක් මිල ඉහළ නඟිමින් පැවැත්තේය. කෙසේ වෙතත් ජූනිවලින් පසු ඒවායේ මිල පහළ ගියේ, මෙම ද්‍රව්‍ය ආයාත කිරීම, 1968 මැයි සිට වි. වි. හි. ස. ක්‍රමය යටතේ, ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

1968 වර්ෂයට කලිනුත් ඉහළ යමින් පැවති මෝටර් රථ උපකරණ මිල, වර්ෂයේ මුල් භාග යේදී තවදුරටත් ඉහළ ගියේය. මෝටර් රථ උපකරණවල මිල ඉහළ යාමට හේතුව රුපියල අවප්‍රමාණ කිරීම නිසා ඒවායේ ඒකක මි.ර.ගැ. අගය වැඩිවීම වශයෙන් දක්වා ඇත. වර්ෂයේ දෙවන භාගයේදී, කිසිදු වැදගත් මිල ඉහළ යාමක් පෙන්නුම් නො කළ හෙයින්, වි. වි. හි. ස. ක්‍රමය යටතේ ආනයනය කිරීම ලිහිල් කිරීම නිසා, මෝටර් රථ උපකරණ හිඟය නැතිවීම හේතු කොටගෙන ඒවායේ මිල තව දුරටත් වැඩිවීම පාලනය වන්නට ඇත. 1968 අප්‍රේල් මාසයේදී පෙට්රල් හා ලිහිසි තෙල් මිල ඉහළ නංවන ලදී. මෙම ඉහළයාමට හේතුව වශයෙන් දක්වා ඇත්තේ අවප්‍රමාණ කිරීම නිසා ඒකක මි.ර.ගැ. අගය ඉහළයාමය.

**අන්තර් භාණ්ඩ**

සියළුම බෙද හරින්නන් විසින් විකුණන සිල්ලර පොහොර මිල, 1968 දී ඉහළ නංවන ලද්දේ, ලංකා රුපියල අවප්‍රමාණ කිරීමෙන් මි.ර.ගැ. අගය ඉහළ යාම හේතු කොට ගෙනය.

**ආයෝජන භාණ්ඩ**

1968 මැද භාගයේදී බොහෝ ගොඩනැගිලි උපකරණවල මිල සැලකියයුතු ලෙස පහළ ගියේය. උදහරණයක් වශයෙන් 1967 අගදී හා 1968 ආරම්භයේදී රු. 20/– ට සිල්ලරට විකුණූ සිමෙන්ති කොට්ටයක මිළ 1968 තුන්වන කාර්තුවේදී රු. 14/– දක්වා පහළ වැටිණ. මෙයටත් වඩා පැහැදිළි අඩුවීමක් සනීපාරක්ෂක උපකරණ සම්බන්ධයෙන් දක්නට ලැබිණ. පහත් මට්ටම් උක්කුටික යුගලයක මිල 1968 අප්‍රේල් මාසයේ රු. 900/– ක්ව තිබී, වර්ෂය අගදී රු. 375/– දක්වා පහළ ගියේය. මෘදු වානේ සහ ජනේල වීදුරු සැහෙන පරිදි මිල පහළ යාමක් දක්වීය. 1968 මැයි මාසයට කලින් මේවා වෙළඳ පොලේ ලබා ගැනීමට බොහෝ විට නොතිබුණ අතර, අතිශයින් ඉහළ මිලකට විකුණන ලදී. වි.වි.හි.ස. ක්‍රමය හඳුන්වාදීම හා එම ක්‍රමය යටතේ මෙම ද්‍රව්‍ය ආනයන කිරීම ලිහිල් කිරීම, මෙකී මිල පහළ යාමට ප්‍රධාන හේතු විය. සිමෙන්ති සම්බන්ධයෙන් පැවති හිඟය අඩුවීමට උදව් කළ තවත් කරුණක් නම් සිමෙන්ති නිමැයුම ඉහළ යාමයි. සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදනය 1968 දී සියයට 16 කින් ඉහළ ගියේයයි වාර්තාගතයි. තෙල් හා සායම් වර්ගවල මිල 1968 දී තරමක් දුරට ඉහළ ගියේ, ප්‍රධාන වශයෙන්ම කියතොත්, පිරිවැටුම් බද්ද 1968 ජූලි මසදී ඉහළ නැංවීම නිසාය.

**මිල පාලනය**

1968 වර්ෂයේදී රජය, බෙහෙත් ද්‍රව්‍ය, කටු කම්බි, හා කූරු කම්බි, මිල පාලනය යටතට ගෙනෙන ලදී. කෙසේ වෙතත් විදුලි බුබුළු, ක්ෂණික එළිය දෙන බැටරි, ට්‍රාන්සිස්ටර් ගුවන්

විදුලි යන්ත්‍ර බැටරි, ගිනියම්ව දිලෙන මැන්ටල්, වියළි බැටරි (ගුවන් විදුලි යන්ත්‍ර), කපු නූල් (සුදු) බයිසිකල් ටයර් හා ටියුබ්, අභ්‍යාස පොත්, මොනිටර් අභ්‍යාස පොත් මිල පාලනයෙන් ඉවත් කරන ලදී.

## වැටුප්

වැටුප් ප්‍රමාණ දර්ශකයන් රජයේ සේවාවේ යෙදී සිටින ශිල්පිය හා ලිපිකාර සේවකයන්, සුළු සේවකයන් හා පාසල් ගුරුවරුන් සහ පෞද්ගලික අංශයට අයත් වැටුප් මණ්ඩල මගින් පාලනය වන කර්මාන්තවල කම්කරුවන් සම්බන්ධයෙන් ලබා ගත හැකිය. රජයේ සේවකයන්ගේ වැටුප් දර්ශකාංක, 1952 පදනම් වර්ෂය වශයෙන් යොදා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කරයි. මෙම දර්ශකාංක, මූලික වැටුප්, වේතන හා ඒ ඒ නියෝජන ශ්‍රේණිවල සේවකයන්ට ගෙවිය යුතු දීමනා පදනම් කොට ගෙන සකසා ඇති අතර, අතිකාල හා වාර්ෂික වැඩිවීම් මෙය ගණනය කිරීමට ඇතුළත් කර නොමැත. පෞද්ගලික අංශයේ කම්කරුවන්ගේ වැටුප් පරිමා දර්ශකාංක, 1952 පදනම් කොට සකසා, කම්කරු දෙපාර්තමේන්තුව පළ කරයි. එම දර්ශකාංක, කෘෂිකර්මයේ යෙදී සිටින කම්කරුවන් සහ කර්මාන්ත හා වාණිජ අංශයේ කම්කරුවන් වශයෙන් කොටස් දෙකකට බෙදා ඇත. වැටුප් මණ්ඩල මගින් නියම කළ අවම වැටුප් හා 1967 දෙසැම්බරයේ සිට ගෙවිය යුතු වන අවප්‍රමාණ දීමනාව පදනම් කොට ගෙන එම දර්ශකාංක, සකසා ඇත. කෙසේ වෙතත්, මේ දර්ශක කම්කරුවන්ගේ නියම ඉපයුම් නිරූපණය නොකරයි. ඔවුන්ගේ නියම ඉපයුම්, වැඩ කරන දින ගණන, වැඩ කරන අතිකාල පැය ගණන සහ පාරිතෝෂික දීමනා වැනි වෙනත් ගෙවීම් යනාදිය මත රඳා ඇත.

සංඛ්‍යා සටහන II (ඌ) 2 රජයේ සේවකයන්ගේ වාර්ෂික සාමාන්‍ය වැටුප් පරිමා දර්ශක අංක පෙන්නුම් කරයි.

### සංඛ්‍යා සටහන II (ඌ) 2

### රජයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක

### ( 1952 = 100 )

| වර්ෂය | ශිල්පී හා ලිපිකාර සේවකයන් | | සුළු සේවකයන් | | රජයේ සේවකයන් (අ) | | රජයේ පාසල් ගුරුවරුන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ |
| 1957 | 111.2 | 108.2 | 116.0 | 112.8 | 113.8 | 110.7 | 113.9 | 110.8 |
| 1958 | 122.3 | 116.5 | 130.4 | 124.3 | 126.7 | 120.7 | 117.4 | 111.8 |
| 1959 | 122.3 | 116.3 | 130.4 | 124.0 | 126.7 | 120.4 | 117.4 | 111.6 |
| 1960 | 122.3 | 118.2 | 130.4 | 126.0 | 126.7 | 122.4 | 117.4 | 113.4 |
| 1961 | 122.3 | 116.7 | 130.4 | 124.4 | 126.7 | 120.9 | 117.4 | 112.0 |
| 1962 | 122.3 | 115.0 | 130.4 | 122.6 | 126.7 | 119.2 | 117.4 | 110.4 |
| 1963 | 122.3 | 112.4 | 130.4 | 119.9 | 126.7 | 116.5 | 117.4 | 107.9 |
| 1964 | 122.3 | 109.0 | 130.4 | 116.2 | 126.7 | 112.9 | 117.4 | 104.6 |
| 1965 | 122.3 | 108.7 | 130.4 | 115.9 | 126.7 | 112.6 | 117.4 | 104.4 |
| 1966 | 122.3 | 108.9 | 130.4 | 116.1 | 126.7 | 112.8 | 117.4 | 104.6 |
| 1967 | 125.4 | 109.2 | 136.2 | 118.6 | 131.3 | 114.4 | 119.4 | 104.0 |
| 1968 | 140.1 | 115.4 | 163.0 | 134.3 | 152.6 | 125.7 | 129.6 | 106.7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ශිල්පී හා ලිපිකාර සේවකයන් සහ සුළු සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

රජයේ සේවයේ සමහර පංතිවල සේවකයන්ට 1967 ඔක්තෝම්බර් සිට අතුරු දීමනාවක් හා 1967 දෙසැම්බරයේ සිට අතුරු අව ප්‍රමාණ දීමනාවක් ලබා දීමෙන් 1968 රජයේ සේවකයන්ගේ වැටුප් පරිමා දර්ශකාංක, 1967 දර්ශකාංක, හා සංසන්දනය කරන කල, ශිල්පීන් හා ලිපිකරුවන්ට සියයට 11.7 කින් ද, සුළු සේවකයන්ට සියයට 19.6 කින් හා රජයේ පාසල් ගුරුවරුන්ට සියයට 8.5 කින් ද ඉහළ ගියේය.

ජීවන වියදම් දර්ශකයෙහි වෙනස්වීම් අනුව ගලපමින් සකස් කරන, මූර්ත වැටුප් දර්ශකයන්ද 1967 ට වඩා 1968 දී ඉහළ ගියේය. මූර්ත වැටුප් දර්ශක, ශිල්පි හා ලිපිකරු කොටසට සියයට 5.6 කින් ද, සුළු සේවකයන්ට සියයට 13.0 කින් ද, රජයේ පාසල් ගුරුවරුන්ට සියයට 2.6 කින් ද ඉහළ ගියේය. මුදල් වැටුප් ප්‍රමාණ දර්ශක ඉහළ යාමට වඩා මූර්ත වැටුප් දර්ශක පහළින් සිටියේ 1967–68 අතරතුරේදී ජීවන වියදම් දර්ශකය ඉහළ යාම හේතු කොට ගෙනය.

II (උ) 3 සංඛ්‍යා සටහන,පඩි පාලක සභා යටතේ ගැනෙන, පෞද්ගලික අංශයේ සේවක-යින්ගේ අවම වැටුප් දර්ශකාංක පෙන්නුම් කරයි.

### සංඛ්‍යා සටහන II (උ) 3

### වැටුප් පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන්ගේ අවම

### වැටුප් ප්‍රමාණ දර්ශක අංක

### ( 1952 = 100 )

| වර්ෂය | කෘෂිකර්මයෙහි නියුතු කම්කරුවෝ | | කර්මාන්තයෙහි නියුතු කම්කරුවෝ | | සියළුම වැටුප් පාලක සභා කර්මාන්තයන්හි නියුතු කම්කරුවෝ (අ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් දර්ශකය |
| 1957 | 108.7 | 105.6 | 104.5 | 101.5 | 107.8 | 104.7 |
| 1958 | 110.2 | 105.2 | 116.1 | 110.9 | 110.8 | 105.6 |
| 1959 | 110.2 | 104.8 | 128.8 | 122.4 | 112.3 | 106.7 |
| 1960 | 110.2 | 106.5 | 128.1 | 123.8 | 111.8 | 108.0 |
| 1961 | 110.7 | 105.6 | 128.4 | 122.5 | 112.3 | 107.2 |
| 1962 | 111.9 | 105.2 | 129.5 | 121.8 | 113.7 | 106.9 |
| 1963 | 113.3 | 104.2 | 130.9 | 120.3 | 115.2 | 105.9 |
| 1964 | 116.0 | 103.5 | 132.8 | 118.4 | 117.8 | 105.0 |
| 1965 | 116.3 | 103.4 | 132.8 | 118.0 | 118.2 | 105.0 |
| 1966 | 116.2 | 103.5 | 133.2 | 118.6 | 118.1 | 105.1 |
| 1967 | 120.4 | 104.9 | 138.9 | 121.0 | 122.2 | 106.4 |
| 1968 | 138.8 | 114.3 | 161.6 | 133.1 | 141.2 | 116.3 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ කම්කරුවන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

පෞද්ගලික අංශයේ කම්කරුවන්ගේ වැටුප් පරිමා දර්ශකාංකවල, වෙනස්වීම්, රජයේ අංශ-යේ සේවකයන්ගේ වැටුප්වල වෙනස්වීමට සමානය. 1967 දෙසැම්බරයේදී ගෙවන්නට පටන් ගත් '' අතුරු අවප්‍රමාණ දීමනාව '' නිසා, කෘෂිකර්මයේ යෙදී සිටින කම්කරුවන්ගේ වාර්ෂික වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 15.3 කින් ද, කර්මාන්ත හා වාණිජ්‍යයේ කම්කරුවන්ගේ වැටුප් පරිමා දර්ශකය සියයට 16.4 කින් ද ඉහළ ගියේය. මූර්ත වැටුප් දර්ශකවල ඉහළ යාම පිළි-වෙලින් සියයට 9.6 හා සියයට 10 විය.

1967 දී හදිසි නීති රෙගුලාසි යටතේ පෞද්ගලික අංශයේ සේවකයන්ට ලබා දුන් ''අතුරු අවප්‍රමාණ දීමනාව'' 1968 වර්ෂයේදී කම්කරු අවප්‍රමාණ දීමනා පනත මගින් නීත්‍යානුකූල කරන ලදී. 1968 සැප්තැම්බරයේදී ජාතික වැටුප් මණ්ඩලයක් පිහිටුවීමේ පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

1968 නොවැම්බරයේදී රජයේ සේවකයන්ගේ දැනට පවත්නා වැටුප්, වේතන හා දීමනා, විශ්‍රාම අයිතිවාසිකම්, නිවාඩු, නිවාඩු ගමන් බලපත්‍ර හා බඳවා ගැනීමේ කොන්දේසි හා තත්වය පිළිබඳ පරීක්ෂා කොට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවක් රජය විසින් පත් කරන ලදී. මෙම කොමිෂන් සභාව රජයේ විවිධ දෙපාර්තමේන්තුවල සේවයේ යොදවා ඇති නිලධාරින්ගේ යෝග්‍ය හා අයෝග්‍යතාව, ප්‍රමාණවත් බව, යනාදිය පරීක්ෂා කරන්නේය.